# පන්ති විෂමතාව තේමා කොටගත් සිංහල ගීත පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කේ. කේ. සිරියලතා**[1]

සමාජයේ හැම පැතිකඩක් ම සිංහල ගීතයට විෂයය වී ඇත. මෙහි දී සමාජයේ ප්‍රබල ලෙස මුල්බැසගෙන ඇති සමාජ ප්‍රශ්නයක්වන පන්ති විෂමතාව කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු වී ඇති බව පැහැදිලි ය. ධනය, බලය, කුලය ආදි සාධකයන් මුල් කරගෙන මේ තත්ත්වය හටගෙන ඇති අතර මෙමඟින් පීඩාවට පත්වන ජනතාව වෙත සානුකම්පිත දෘෂ්ටියකින් නිර්මාණයකර ඇති ගීත බොහෝමයකි. සිංහල ගීත පිළිබඳ විවිධ පර්යේෂණ සිදු කර ඇතත් උක්ත තේමාව සම්බන්ධයෙන් මෙතෙක් විශේෂ අවධානයක් යොමු වී නොමැත. ඇතැම් පර්යේෂණවල දී මේ ප්‍රස්තුතය සම්බන්ධයෙන් මඳ වශයෙන් තොරතුරු මතු කර දැක්වීමට දරා ඇති ප්‍රයතන්යන් ප්‍රකට වූවත් එමඟින් මේ ප්‍රස්තුතය පිළිබඳ නිරවුල් අවබෝධයක් ලද නොහැකි ය. මේ පර්යේෂණය සඳහා විද්‍යුත් මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍ය ආශ්‍රය කරගැනිණි. සිංහල ගී පද රචකයන් බොහෝ දෙනා සිය නිර්මාණකරණයේ දී ගැඹුරින් සමාජය ස්පර්ශ කරමින් ස්වකීය නිර්මාණ කරණයෙහි නියැලී ඇත. මේ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් වශයෙන් උක්ත ප්‍රස්තුතය සිංහල ගීතයේ තේමාව බවට පත් වී ඇත, නාද මාලාව ඒ හා මුසු වන මධුර ස්වරය මැනවින් සංකලනය කරමින් අදාළ ප්‍රස්තුතය කුළුගැන්වීම සඳහා නිර්මාණකරුවෝ අපූර්ව ප්‍රතිභාවක් දැක්වූ හ. සංක්ෂිප්ත කලා මාධ්‍යයක්වන ගීතයට සහෘදයා ක්ෂණයෙන් තමා වෙත සමීප කරගැනීමේ හැකියාව පවතී. ඒ ශක්තිය නිසා සෙසු කලා මාධ්‍ය අබිබවා ගීතය පෙරට පැමිණ ඇති අතර සමාජ සත්තාවන්හි යථාර්ථය පසක් කරදීමට ද ගීතය කිසියම් මෙහෙයක් ඉටු කරන බව පැහැදිලි ය. මේ පර්යේෂණයෙන් සිංහල ගීතයෙන් නිරූපිත සමාජ විෂමතාව කෙබඳු ද යන්න වෙන් වෙන් ව හඳුනාගැනීමත්, ඒ ඒ නිර්මාණකරුවන් සමාජ විෂමතාව සිය දෘෂ්ටියට හසු කරගෙන ඇත්තේ කෙසේ ද යන්න විමසා බලීමත් සිදු කෙරේ.

**ප්‍රමුඛ පදඃ** ගීත සාහිත්‍යය, පන්ති විෂමතාව, සානුකම්පිත දෘෂ්ටිය, නාදමාලාව, සමාජ සත්තාව

[1] සිංහල අධ්‍යයනාංශය